# පිළිසඳර
# PILISANDARA

2018
මාර්තු/ අප්‍රේල්
npassrilanka@gmail.com

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
Educational and News Bulletin of the National Photographic Art Society of Sri Lanka



ජ්‍යෙෂ්ඨ මහාචාර්යතුමන් හට සංගමයෙන් සමරු ඡායාරූපයක්



## ඇතුළු පිටු

» 42 වන වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය
» 2018 නවකයන් උණුසුමින් පිලිගනිමු!
» LNPAS, ANPAS, FNPAS අයදුම් කිරීම
» විහාරමහාදේවී ඡායාරූප වැඩමුළුව
» මෙවරත් සාර්ථක අර්ධ වාර්ෂික මහා සභාවක්
» වාර්ෂික සුහද හමුව
» ඔබට කෙරෙන දැනුම් දීමයි
» වාර්ෂික සමාජ සත්කාරය 2018
» මෙවර එක්දින චාරිකාව
» සේයාරූ ඇදුරු ජන්ම දින සමරු පිංකම
» අපට ඔබව අවශ්‍යමයි
» අපේ විත්තියෙන් ඔබේ වතගොත
» ස්වර්ණ මුද්‍රිකාලාභීන්
» මාසික තරග ජයග්‍රහණ

**වාර්ෂික මහා සභාව**

**වාර්ෂික සුහද හමුව**

**ජූලි මාසේ 15 වෙනිදා**

**දැන්ම දිනය වෙන් කර ගන්න..**




QD/81/NEWS/2018

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
තැ.පෙ. 452, කොළඹ

# 42 වන වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය 2018
# 42ND ANNUAL EXHIBITION OF PHOTOGRAPHY

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය මගින් සංවිධානය කරනු ලබන 42 වන වාර්ෂික ඡායාරූප තරගය සහ ප්‍රදර්ශනයට සහභාගි වන ලෙස සාමාජික, සහෘද ඔබ සැමට ගෞරවයෙන් ආරාධනා කෙරේ. තරග අංශ 5 කි. ඕනෑම තේමාවක් යටතේ කෘති ඉදිරිපත් කළ හැකිය.

01. ආධුනික - ඒක වර්ණ Monochrome
02. ආධුනික - වර්ණ Colour
03. විවෘත - ඒකවර්ණ Monochrome
04. විවෘත - වර්ණ Colour
05. ජංගම දුරකථන Hand Phone

**කෘතීන් භාර ගන්නා අවසන් දිනය - 2018 මැයි 27**

විමසීම :
අධ්‍යක්ෂ ප්‍රදර්ශන,
උදේනි අල්විස් - 0777 75 18 19

**ත්‍යාග**
සෑම අංශයක් සඳහාම පිළිවෙළින් පළමු, දෙවන, තුන්වන ස්ථාන සඳහා වටිනා ත්‍යාග, සහතිකපත් සහ සම්මාන පිරිනමනු ලබන අතර සෑම අංශයක් සඳහාම කුසලතා සහතික 5 බැගින් පිරිනමනු ලැබේ. ජංගම දුරකථන අංශය සඳහා පළමු, දෙවන, තුන්වන ස්ථාන සඳහා වටිනා ත්‍යාග සහතික පත් ද කුසලතා සහතික 5 ක් ද පිරිනමනු ලැබේ.

**තරග කොන්දේසි**
එක් අංශයක් වෙනුවෙන් ඉදිරිපත් කළ හැකි උපරිම කෘති සංඛ්‍යාව හතරකි. ඡායාරූප වල ආලෝක තීව්‍රතාව, වර්ණ වෙනස් කිරීම් හෝ වෙනත් ප්‍රයෝග (Special Effects) පරිගණක මෘදුකාංග මගින් සිදුකළ හැකි අතර, ඡායාරූපයට එකතු කරනු ලබන සියලුම ඡායාරූප තමන් විසින් ගනු ලැබූ ඒවා විය යුතුය. නිර්මාණ සඳහා යොදාගනු ලබන සියලුම ඡායාරූප අන්තර්ජාලය වැනි වෙනත් මූලාශ්‍ර මගින් ලබාගත් හිමිකම් ඇවිරුණු (Copyrighted) හෝ නිදහස් අයිතිය (Royalty-free) සහිත ඒවා නොවිය යුතුය. ත්‍යාග දිනූ ඡායාරූපයක එවැනි සත්‍යතාව පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වුවහොත් මුල් ගොනු (RAW Files) ඉදිරිපත් කළ යුතුය.

සියලුම කෘතීන් ඩිජිටල් මාධ්‍යයෙන් JPEG/sRGB ක්‍රමයට විවෘත අංශ විද්‍යුත් තැපෑලෙන් පමණක් ද ආධුනික අංශ DVD මගින් ද ඉදිරිපත් කළ යුතුය.
ආධුනික අංශය සඳහා ඡායාරූප ඉදිරිපත් කළ හැක්කේ ඡායාරූප ශිල්පය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ උපාධියක් ලබා නොමැති සහ ආයතන ගතව විෂය හදාරන අයට පමණි. ඒ පිළිබඳව අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය අයදුම් පත්‍රය දක්වා ඇති ස්ථානයේ සඳහන් ව තිබිය යුතුය.

ඡායාරූප විනිශ්චය කිරීම සඳහා දිග පැත්ත පික්සල් 1400 හා/හෝ පළල පැත්ත පික්සල් 1050 සැකසූ ඡායාරූප පහත සඳහන් ආකාරයට නාමකරණය කර විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය. ඡායාරූප (Image) පහත සඳහන් පරිදි නාමකරණය කළ යුතුයි.

ප්‍රදර්ශනය සඳහා තෝරාගත් ඡායාරූප මුද්‍රණය කිරීම සඳහා ඉහත ඔබ ඉදිරිපත් කළ ඡායාරූප දිග පැත්ත 40 cm හා විභේදන බලය (Resolution) 300 dpi වලට සකසා ඉහත ආකාරයට ම නාමකරණය කර විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය. DVD මගින් ඡායාරූප ඉදිරිපත් කරන්නන් ඉහත සඳහන් පරිදිම විනිශ්චය සඳහා වෙනම ගොනුවක් ද (Folders) මුද්‍රණය සඳහා වෙනම ගොනුවක් වශයෙන් ද වෙන වෙනම ගොනු දෙකක් DVD වල තැන්පත් කර එවිය යුතුය.

**ඇතුළත් වීමේ ගාස්තු**
විවෘත එක් අංශයකට ඇතුළත්වීමේ ගාස්තුව රු. 750 /- කි. අංශ දෙකම සඳහා රු. 1000/- කි. ආධුනික එක් අංශයක් සඳහා රු. 300/- කි. අංශ දෙකම සඳහා රු. 500/- කි. ඊට අතිරේක වශයෙන් ජංගම දුරකථන අංශය සඳහා ඇතුළත් වීමේ ගාස්තුව රු. 500/- කි.

ඇතුළත්වීමේ ගාස්තු ගෙවීම් ඕනෑම සම්පත් බැංකු ශාඛාවක් මගින් බොරැල්ල සම්පත් බැංකුවේ ගිණුම් අංක 000460002133 ට මුදල් බැර කර ලදුපතෙහි මුල් පිටපතේ ඡායාරූපයක් (Image) හා විවෘත අංශයේ ඔබගේ ප්‍රදර්ශන ඡායාරූප 42exnpas@gmail.com විද්‍යුත් තැපැල මගින් එවිය යුතුය. ආධුනික අංශයට ඉදිරිපත් වන අය ඉහත ගිණුමට මුදල් බැර කර එම ලදුපතත් සමග **DVD** භාරදිය යුතුය.

**ඡායාරූප නාමකරණය**
ආධුනික ඒකවර්ණ AM1 - මාතෘකාව | විවෘත ඒක වර්ණ OM1 - මාතෘකාව, ජංගම දුරකථන HP1 - මාතෘකාව

විවෘත අංශයට ඡායාරූප ඉදිරිපත් කරන්නන් ජංගම දුරකථන අංශයටත් ඡායාරූප ඉදිරිපත් කරන්නේ නම් ඒ සියල්ල (Image) එවිය යුත්තේ විද්‍යුත් තැපැලෙන් වන අතර, ආධුනික අංශයට ඡායාරූප ඉදිරිපත් කරන්නන් ජංගම දුරකථන අංශයටත් ඡායාරූප ඉදිරිපත් කරන්නේ නම් ඒ සියල්ල (Image) DVD මගින් ලබා දිය යුතු ය. ඡායාරූප එවිය යුතු විද්‍යුත් ලිපිනය 42exnpas@gmail.com

**අයදුම්පත් බාගත කර ගැනීම**
www.npasslanka.org යන අපගේ වෙබ් අඩවියෙන් හෝ facebook.com/TheNationalPhotographicArtSocietyOfSriLanka යන අපගේ ෆේස්බුක් පිටුව මගින් අයදුම් පත්‍ර බාගත කළ හැක.


ආධුනික අංශයට ඉදිරිපත් වන්නන් DVD සමග සහතික කරන ලද අයදුම් පතක් භාරදිය යුතුය. මීට පෙර දීපව්‍යාප්ත ප්‍රදර්ශන සඳහා ඉදිරිපත් කර ත්‍යාග දිනූ ඡායාරූප මෙම ප්‍රදර්ශනය සඳහා භාරගනු නොලබන අතර එවැනි ඡායාරූප විනිශ්චයෙන් පසුව හෝ හඳුනාගතහොත් ඉවත් කිරීමේ අයිතිය සහ සියලු සහතික පත්, ත්‍යාග හා සම්මාන අවලංගු කිරීමේ අයිතිය ප්‍රදර්ශන කමිටුව සතුවේ.ප්‍රදර්ශනය සඳහා සුදුසුකම් ලැබූ ඡායාරූප සංගමය මගින් මුද්‍රණය කොට ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. එසේම එම ඡායාරූප මෙම සංගමයේ ප්‍රචාරක කටයුතු සඳහා යොදාගැනීමේ අයිතිය සංගමය සතු වන අතර ඒ සඳහා කිසිදු ගෙවීමක් සිදු කරනු නොලැබේ. ඡායාරූප තේරීමේ අවසාන තීරණය ඇගයීම් කමිටුව සතුවේ. තවද ඡායාරූප විනිශ්චය කිරීමෙන් පසුව හෝ තරග කොන්දේසිවලට අනුකූල නොවන ඡායාරූප පිළිබඳව දැන ගැනීමට ලැබුණහොත් එම ඡායාරූප ප්‍රදර්ශනයෙන් ඉවත් කිරීමේ සම්පූර්ණ බලය ප්‍රදර්ශන කමිටුව සතු වන අතර, ඒ පිළිබඳ කිසිදු ලිපි ගනුදෙනුවක් නොකෙරේ. ඡායාරූප අඩංගු DVD හා ප්‍රදර්ශනය සඳහා මුද්‍රණය කළ ඡායාරූප නැවත භාරදෙනු නොලැබේ.

# LNPAS ANPAS FNPAS අයදුම් කිරීම

ඡායාරූප ශිල්පීන් නිර්මාණ කුසලතා සහ ශාස්ත්‍රීය දක්ෂතා අගයමින් සංගමය මගින් පිරිනමන ඉහත සඳහන් සම්මාන මෙම පරීක්ෂණය සඳහා අයදුම් කළ හැකි අවසන් දිනය මැයි මස 28 වේ. පරි/ 007/ 004 අංක දරන චක්‍රලේඛයේ ප්‍රතිපාදන පරිදි මේ සඳහා ඉල්ලුම් කළ හැකි ය.

(මෙම චක්‍රලේඛයේ අත්‍යවශ්‍ය කරුණු ඇතුළත් උපුටනය 2016 ජූලි/අගෝස්තු පිළිසඳර කලාපයෙන් ඔබ වෙත එවා ඇත.) අවශ්‍ය වැඩිමනක් විමසුම් වේ නම්, ගරු ලේඛකාධිකාරී උපනන්ද සෙනෙවිරත්න මහතා (071 4901200) අමතන්න.

අදාල සම්මාන ජූනි මස 15 දින පිරිනැමීමට විධිවිධාන යොදා ඇති බැවින් ප්‍රමාද වන අයදුම්පත් ඉදිරි වර්ෂය සඳහා කල්තැබීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න





## 2018 නවකයන් උණුසුමින් පිළිගනිමු!

මෙම වර්ෂය සඳහා නවක සාමාජික සාමාජිකාවන් බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණය ජනවාරි මස 07 වැනි දින පැවැත්වූ අතර එහි දී තෝරාගනු ලැබූ 215 ක සාමාජික සංඛ්‍යාවක් මෙවර සාමාජිකත්වය සඳහා ඇතුළත් වූහ. නිළ වශයෙන් ඔවුන් පිළිගැනීමේ සහ ඡායාරූප ශිල්ප පාඨමාලාව ආරම්භ කිරීමේ උත්සවය ජනවාරි මස 28 වැනි දින කොළඹ මහවැලි කේන්ද්‍රයේ දී උත්කර්ෂවත් ලෙස පැවැත්විණි.

මෙම සැසියේ ප්‍රධාන ආරාධිත දේශනය කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ මහතා විසින් පවත්වන ලද අතර, එම උත්සව සභාවට සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික භවතුන් රැසක් පැමිණ සිටියහ. මෙදින උත්සවයේ සියලු සත්කාර සංග්‍රහ කාර්යයන් දෙවන වසර විද්‍යාර්ථීන් කණ්ඩායම විසින් සිදුකරන ලදී. සංගමය වෙනුවෙන් ඔවුන් ඉටුකළ එම සද්කාර්යය සඳහා විශේෂ ස්තූතිය පුදකරන අතර සංගමය සමග අත්වැල්බැදගත් නවක සාමාජික භවතුන් ඉතා උණුසුම් සහෝදරත්වයෙන් යුතුව පිළිගනිමු.

## විහාරමහාදේවී උද්‍යාන ඡායාරූප වැඩමුළුව 2018





**වාර්ෂිකව පැවැත්වෙන විහාරමහාදේවි උද්‍යාන ඡායාරූප වැඩමුළුව මෙවර මැයි මස 13 වන දින පැවැත්වුනි. විහාරමහාදේවි ඡායාරූප තරගයෙන් ඒකවර්ණ ප්‍රථම ස්ථානය සඳහා පිරිනැමෙන බී.පී. වීරවර්ධන ශූරතා පළිහ මෙවර ද පිරිනැමීමට නියමිතය. මේ සඳහා තෙවසරේම විද්‍යාර්ථයින් සහභාගී වූ අතර සම්පත් දායකත්වය අප ජ්‍යෙෂ්ඨ සාමාජිකත්වයෙන් මෙවර ද නොමසුරුව ලැබුණි.**

## මෙවරත් සාර්ථක අර්ධ වාර්ෂික මහා සභාවක්



අර්ධ වාර්ෂික මහා සභාව ජනවාරි මස 14, රාජගිරියේ සිංහ සමාජ ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි. ගරු අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළුව ජ්‍යෙෂ්ඨ සාමාජික භවතුන්ගේ සහභාගීත්වයෙන් මෙවර සභාව ද පැවැති අතර සංගමයේ ඉදිරි කටයුතු පිළිබඳව මෙන්ම මෙම වසරේ ප්‍රදර්ශනය සම්බන්ධයෙන් සංගමයේ සාමාජිකභවතුන් දැනුවත් කිරීම මුඛ්‍ය කටයුත්තක් ලෙස සිදු කෙරිණි.

## වාර්ෂික සුහද හමුව ජූලි 15



*සාමාජික බැඳීම් තරකරලීම පිණිස සංවිධානය කෙරෙන සුහද හමුව ජූලි මස 15 වැනි දින පස්වරු 02.00 සිට රාජගිරිය සිංහ සමාජ මධ්‍යස්ථානයේ දී පැවැත්වේ. වාර්ෂික මහා සභාවෙන් අනතුරුව උදාවන හෝරා කිහිපය තුළ අප-අප අතර ලෙන්ගතු කතාබහකට ඉඩකඩ උදාකරන මේ සොඳුරු මොහොතට ඔබේ සහෝදරාත්මක දෑත් එක්කරන්න. මේ පිළිබඳ වැඩි තොරතුරු සමාජසේවා අධ්‍යක්ෂ වජිර වික්‍රමගේ මහතාගෙන් ලබාගන්න. (0775 317 608)*

## ඔබට කෙරෙන දැනුම් දීමයි...




2018 වසර සඳහා නවක සාමාජික භවතුන්ගේ ඉල්ලීම පරිදි සූදානම් කරන ලද අධ්‍යයන කට්ටල 14 ක් පමණ ඔවුන් විසින් ලබා නොගැනීම හේතුවෙන් ඉතිරි වී ඇත. මේ සඳහා වන රුපියල් 1500 මුදල ගෙවා එම ප්‍රදානයන් භාර නොගත් දෙදෙනෙකු ද මේ අතර වේ. වහාම තමාට හිමි අධ්‍යයන කට්ටල ලබාගන්නා මෙන් ඔවුන්ට දැනුම් දෙන අතර ඉතිරි අනිකුත් කට්ටල සාමාජික ඔබට ද ලබාගත හැකි ය. එකක මිල රුපියල් 1500 ක් වන අතර ඊට ටී ෂර්ට් එකක්, ෆයිල් කවරයක්, පෑනක්, පිටු 200 ඡායාරූප සටහන් පොතක්, ශාස්ත්‍රීය ග්‍රන්ථයක් සාමාජික තොරතුරු ඇතුළත් ඩිරෙක්ටරියක්, ඡායාරූප ශිල්ප ආචාරධර්ම සංග්‍රහය සහ බෑගයක් ද ඇතුළත් වේ. අවශ්‍ය අය මැයි 30 දිනට පෙර 071-8106680 අංකයෙන් උදිත අමතන්න. ඊට අතිරේකව මේ වසර සඳහා සකස් කරන ලද සංගමයේ ටී ෂර්ට් අවශ්‍ය අය සිටී නම් ඔවුනට තමාගේ කමිස ප්‍රමාණය කල් තබා දුරකථන ඇමතුමකින් දැනුම් දී ඉරුදින ඡායාරූප පංතියට පැමිණ ඒවා ලබාගත හැකි ය.

## වාර්ෂික මහා සභාව ජූලි 15.. දිනය කල්තබා වෙන්කරගන්න..

**2018 වසරේ වාර්ෂික මහා සභාව ජූලි මස 15 වැනි ඉරු දින පෙ. ව. 9.00 ට රාජගිරිය සිංහ සමාජ ශ්‍රවණාගාරයේ දී පැවැත්වීම ට කටයුතු සූදානම් කර ඇත. මේ පූර්ව දැනුම් දීම ඔබගේ විශේෂ අවධානය යොමුකොට දිනය කල්තබා වෙන්කරගනු උදෙසා ය. න්‍යායපත්‍රය සහ නිල ආරාධනා පත්‍රය ඉදිරි පිළිසඳර සමග ඔබ අතට පත්වනු ඇත.**

## මෙවර එක්දින චාරිකාව කන්නෙලිය



වාර්ෂික එක්දින චාරිකාව කන්නෙලිය වන රක්ෂිතය වෙත ළඟාවීමටත්, ඡායාරූපගත කිරීම් ඇතුළු සාමාජික හා සුභසාධන අංශය කටයුතු සැලසුම් කොට ඇත. ඒ සඳහා ජූලි මස 27 වන දිනය වෙන්කර තබාගන්නා ලෙස සමාජසේවා හා සුභසාධන අධ්‍යක්ෂ වජිර වික්‍රමගේ මහතා ඔබ වෙත දන්වා සිටී.

## ඡායාරූප කලා උපදේශක සභාවේ සභාපතිත්වයට බර්ටි ගුණසේකර



සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ඡායාරූප කලා උපදේශක සභාවේ නව සභාපති ලෙස අප සංගමයේ ගෞරව සාමාජික බර්ටි ගුණසේකර මහතා පත්වී සිටී.

ඒ මහතාටත් එම සභාව නියෝජනය කරන අපගේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් වන තිලක් ගොඩමාන්න, ජී හෙට්ටිආරච්චි, බන්දු ගුණරත්න, හර්ෂ මධුරංග ජයසේකර යන මහත්වරුන්ටත් අපගේ සුබ පැතුම් පිරිනමමු.

# අපේ විත්ති

## Captured Moments උත්කර්ෂවත්ව පැවැත්වේ















සම්මානලාභී ඡායාරූප ශිල්පී, සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික චන්ද්‍රසේන පෙරේරා මහතාගේ සිව් වැනි ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය Captured Moments 4 නමින් මාර්තු 23, 24,25 යන දිනවල කොළඹ ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේ දී උත්කර්ෂවත් අයුරින් පැවැත්විණි.

ඒ මහතාගේ සම්මානලාභී ඡායාරූප මෙන් ම නව නිර්මාණ 60 කට අධික සංඛ්‍යාවක් මෙහි දී දැක බලාගැනීමට හැකි වූ අතර ප්‍රදර්ශන සමරු කලාපයට අමතර ව "ආකර්ෂණා" නම් සමරු ග්‍රන්ථය එළිදැක්වීම ද ප්‍රදර්ශනයේ සමාරම්භක උළෙලේ දී සිදුවිය.

## ශාන්තට, ලලිත්ට, රවීට චීනයෙන් ජයග්‍රහණ

පසුගිය දෙසැම්බරයේ චීනයේ පවත්වන Xanmenxia White Swan ජාත්‍යන්තර වනජීවී ඡායාරූප වැඩමුළුවේ ඡායාරූප තරගයෙන් අප සංගමයේ සම්මානලාභී ඡායාරූප කලාවේදීන් වන ශාන්ත ගුණරත්න මහතා දෙවන ස්ථානයත්, වෛද්‍ය ලලිත් ඒකනායක මහතා තුන්වන ස්ථානයත්, රවීන්ද්‍ර සිරිවධන මහතා දසවන ස්ථානයත් දිනාගැනීමට සමත් විය. වැඩමුළුවට සහභාගී වූ ශ්‍රී ලාංකික කණ්ඩායමට ජ්‍යෙෂ්ඨ සාමාජික රෝහිත ගුණවර්ධන මහතා ද ඇතුළත් විය. රටවල් 14 ක ඡායාරූප ශිල්පී කණ්ඩායම් මීට සහභාගී වූ අතර වැඩි ජයග්‍රහණ ප්‍රමාණයක් අත්පත් කරගන්නට ශ්‍රී ලාංකිකයින් සමත්වීම ප්‍රශංසාත්මක ය. අපි ඒ සියලුදෙනාට ම සුබපතමු.

## සමීර කොතලාවලට FIAP රිදී පදක්කමක්


සංගමයේ දෙවන වසර විද්‍යාර්ථියකු වන සමීර කොතලාවල මහතා චෙක් ජනරජයේ පැවැත්වූ "April 2018" ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනයේ දී විවෘත වර්ණ අංශයේ FIAP රිදී පදක්කමක් දිනාගෙන ඇත. ඒ මහතාට නිර්මාණශීලී ඉදිරි ගමනට සංගමයේ සුබ පැතුම් එක්කරමු.



## නිරෝගී සුව..

පසුගිය මාස කිහිපය තුළ අනපේක්ෂිත අසනීප තත්වයට ගොදුරු වූ පහත නම් සඳහන් සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික භවතුන්ට කඩිනම් නිරෝගී සුව ප්‍රාර්ථනා කරමු.

- චන්ද්‍රසේන පෙරේරා මහතා
- එල්. බී. එස්. එස්. බාලසූරිය මහතා
- සමල් පී. පෙරේරා මහතා
- අමරා වීරසේකර මිය







## ස්වභාවී 3 ජූලි 06 වැනිදා



සංගමයේ හිටපු අධ්‍යක්ෂවරයෙකු මෙන් ම පාඨමාලා උපදේශකවරයෙකු වන ප්‍රවීණ චිත්‍ර මූර්ති හා ඡායාරූප ශිල්පී ප්‍රියන්ත අබේසුන්දර මහතාගේ තුන්වන නිර්මාණ එළි දැක්ම "ස්වභාවී" ජූලි 06 වන දා සිට 09 දා දක්වා ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. තෛලසායම් සිතුවම්, රේඛා චිත්‍ර මෙන් ම කුඩා ප්‍රමාණ මූර්ති ද මෙහි ප්‍රදර්ශනය කිරීමට නියමිත ය. ප්‍රදර්ශනය දින 03 ක් පුරා පෙරවරු 9.00 සිට රාත්‍රී 7.00 දක්වා මහජන දැක්ම වෙනුවෙන් විවෘතය. ඒ සඳහා ඔබ සැමට ආරාධනය කරමු.


## මීගමුව ඡායාරූප සංගමයේ නව පත්වීම්

අප සහෝදර ඡායාරූප සංගමයක් වන මීගමුව ඡායාරූප ශිල්පීන්ගේ සංගමයේ 2018 වර්ෂයේ නිල මණ්ඩලය සඳහා අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික හවතුන් රැසක් පත්වී සිටී. සමන් ප්‍රනාන්දු මහතා සභාපති ලෙස ද ප්‍රියංකර ගමගේ මහතා ලේකම් ලෙසද, හසිත ධනංජය මහතා අධ්‍යාපන ලේකම් ලෙසද යූ. වී. සිරිවිමල මහතා උප භාණ්ඩාගාරික ලෙසද තෝරාගෙන ඇත. ඔවුනට අපගේ සුබපැතුම් එක්කරමු.

ඔබේ තොරතුරුත් අපේ විත්තියට කියන්න - 0716 450 871/ kmanujith@gmail.com

# සමාජ සේවා පුවත්

## ජේ්‍යාරූ ඇදුරු ජන්ම දින සමරු පිංකම..



සංගමයේ නිර්මාතෘ දිවංගත විල්සන් හෑගොඩ මහතාගේ 103 වන ජන්ම දිනය නිමිති කර 2018 ජනවාරි 07 වෙනි දින, බොරැල්ල ශ්‍රී ලංකාරාම විහාරයේ දී ආලෝක පූජා පිංකමක් හා බොරැල්ල වැඩිහිටි නිවාසයේ නේවාසිකයින් වෙත අත්‍යවශ්‍ය වන ද්‍රව්‍ය පිරිනැමීම සිදුවිය. මේ සඳහා සංගමයේ සාමාජික හවතුන් මෙන්ම හෑගොඩ මහතාගේ පවුලේ ඥාතීහු ද සහභාගී වූහ.

## HMR දෙවන ගුණ සැමරුම

සංගමයේ හිටපු සභාපතිවරයකු මෙන් ම සෑම අංශයකට ම ක්‍රියාකාරී දායකත්වය සැපයූ අභාවප්‍රාප්ත එච්. එම්. ආර්. පෙරේරා මැතිතුමන්ගේ දෙවන ගුණ සැමරුම 2018 අප්‍රේල් මස 22 වන ඉරුදින කොළඹ සම්බෝධි විහාරයේ දී පැවැත්විණි. මේ සඳහා බෞද්ධයා රූපවාහිනී නාලිකාවේ ධර්ම දේශනයක් පැවැත්වීමට පවුලේ ඥාතීන් විසින් කටයුතු සැලසුම් කරන ලදුව රාජකීය පණ්ඩිත රදාවඩුන්ගේ විමලඥාන හිමිපාණන් විසින් එකී දම් දෙසුම පවත්වන ලදී. සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික හවතුන්, පෙරේරා පවුලේ ඥාතීන් හා හිතවතුන් මේ සඳහා සහභාගී විය.

## වාර්ෂික සමාජ සත්කාරය 2018

### මරදම්මඩුව විදුහල - නේරියකුලම

වවුනියාව - නේරියකුලම - මරදම්මඩුව විදුහලේ සියලු ම සිසුන් වෙත පොත් පත් හා පාසල් උපකරණ බෙදාදීමේ වැඩ සටහන මාර්තු 02 වන දින සිදුවිය. මෙම වැඩසටහන සඳහා සහභාගී වූ සැමටත්, ද්‍රව්‍යමය හා මුදල් පරිත්‍යාග සිදු කළ සාමාජික, සාමාජිකාවන් සැමටත් සමාජ සේවා අධ්‍යක්ෂතුමන් සිය ස්තූතිය පළකර සිටී.












# අපගේ ශෝකය

- ජ්‍යෙෂ්ඨ සාමාජිකා රේණුකා දමයන්තී මියගේ දයාබර පියාගේ අභාවය දැනුම් දෙනුයේ ඉතාමත් සංවේගයෙන් යුතුව ය.
- ක්‍රියාකාරී සාමාජික ආර්. එම්. මඩවල මහතාගේ දයාබර පියාගේ අභාවය දැනුම් දෙනුයේ ඉතාමත් සංවේගයෙන් යුතුව ය.
- ක්‍රියාකාරී සාමාජික උදය සමරතුංග මහතාගේ දයාබර පියාගේ අභාවය ද දැනුම් දෙනුයේ ඉතාමත් සංවේගයෙන් යුතුව ය.




- සංගමයේ සියළු කාර්යයන් සඳහා සහයෝගය ලබාදුන් තාක්ෂණවේදී චිත්‍රක අඹේපිටිය මහතා හදිසියේ අභාවප්‍රාප්ත විය. එම අභාවය පිළිබඳ සංගමයේ බලවත් ශෝකය පළකෙරේ.
- සංගමයේ ගෞරව සාමාජික ආචාර්ය ධර්මසේන පතිරාජ මහතා ද අභාවප්‍රාප්ත වූයෙන් ඒ පිළිබඳ අප සංගමයේ සාතිශය සංවේගය පළ කරමු.



- සංගමයේ ගෞරව සාමාජික ලෝක පූජිත සිනමාවේදී ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ අභාවය පිළිබඳ සියලු සාමාජික හවතුන්ගේ බලවත් සංවේගය ප්‍රකාශ කර සිටිමු.

# ගොඩනැගිලි අරමුදලට අපිත් දායක වෙමු..



ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ මූලස්ථානය සඳහා අරමුදල් සම්පාදනය පිළිබඳ ඉදිරිපත් වූ යෝජනා මූලස්ථාන ප්‍රතිෂ්ඨාපන කමිටුවේ අවධානයට බඳුන් කරන ලදුව, ඔරොත්තු දෙන ගෙවීම් ක්‍රමවේදයකට අනුව සංගමය වෙත මුදල් ලබා දීමට හැකි වැඩ පිළිවෙළක් යෝජනා කෙරිණි. ඒ අනුව පහත සඳහන් ගෙවීම් ක්‍රම තුනට යටත් ව රු. 12000/= ක මුදලක් සපයා දීමෙන් ඒ සඳහා මේ මොහොතේ අත්‍යවශ්‍ය ම වන ඔබේ දායකත්වය සංගමය වෙත ලබා දෙන ලෙස මහත් කාරුණික ව ඉල්ලා සිටිමු.

මේ සඳහා වන ඔබේ පරිත්‍යාගය, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ප්‍රධාන ශාඛාවේ 100010100838 අංක දරණ ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ගොඩනැගිලි අරමුදල් ගිණුමට බැර කළ හැකි ය. නොඑසේ නම් එය ගරු මුදල් අධ්‍යක්ෂතුමා වෙත මුදලින් ලබා දිය හැකි ය.

## ගෙවීමේ ක්‍රම විධි

**01. එකවර රු. 12000 ක මුදල පරිත්‍යාග කිරීම**.

**02. 2018 දෙසැම්බර් 31 දිනට පෙර රු. 6000 ක මුදලක් සහ 2019 දෙසැම්බර් 31 ට පෙර ඉතිරි රු. 6000 ක මුදල පරිත්‍යාග කිරීම**.

**03. මසකට රු. 1000 බැගින් මාස 12 ක කාලයක් අඛණ්ඩව සංගමය වෙත මුදල් පරිත්‍යාග කිරීම**.

ඉහත කවර හෝ ක්‍රමයකට අනුව රු. 12000 ක මුදල් ගෙවා සම්පූර්ණ කිරීමෙන් පසු ඔබගේ එකී අපරිමිත සහයෝගය හා ආශීර්වාදයට උපහාරයක් ලෙසින්, මූලස්ථාන ස්වර්ණ මුද්‍රිකාවක් සහ සහතික පත්‍රයක් ඔබ වෙත ගෞරව බහුමානයෙන් ප්‍රදානය කරන්නට අධ්‍යක්ෂ මණ්ඩලය බලාපොරොත්තු වේ. මෙලෙස මූලස්ථාන ව්‍යාපෘතියට දායකත්වය එක්කරන්නට සංගමයේ සාමාජික සාමාජිකාවන් රැසක් දැනටමත් ඉදිරිපත් වී සිටිති. සාමාජික ඔබ මෙන් ම සංගමයේ ඉදිරි ගමනට ආශීර්වාද කරන බාහිර පරිත්‍යාගශීලී හිතවතුන් හා පින් කැමති අයගේ දායකත්වය ද මූලස්ථාන ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම පිණිස වන මහත් උපකාරයකි. අප සංගමයේ සාමාජිකයෙකු නොවූවද අපට උදව් කරන්නට කැමති ඔබේ හිතවතුන් ද මේ සඳහා සම්බන්ධ කරදෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

**අපේ මහගෙදර..**
**අපිම තනමු..**

## ගොඩනැගිලි අරමුදලට ශක්තියක් වූ ස්වර්ණ මුද්‍රිකාලාභීන්

**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ මූලස්ථාන අරමුදලට සවියක් වෙමින් සංගමයේ ඉදිරි ගමනට ආශිර්වාද කළ පරිත්‍යාගශීලීන් හට ස්වර්ණ මුද්‍රිකා පිරිනැමීමේ පළමු අදියර පසුගිය අර්ධ වාර්ෂික මහා සභාවේ දී සිදු කෙරිණ. සැමදා සංගමයේ අභිවෘද්ධිය පතමින් සංගමය සමග සිටින ඔබ සැමදෙනාහට අපගේ ගෞරවාචාරය පිරිනමමු**.

- මංගල එදිරිසිංහ මහතා
- එල්. බී. එස්. එස්. බාලසූරිය මහතා
- සුනිල් වික්‍රම මහතා
- ජේ. පී. ද අල්විස් මහතා
- නන්දනී හෙට්ටිආරච්චි මිය
- උදිත ගුණසේකර මහතා
- ටී. එස්. ටී. ද සිල්වා මහතා
- සම්පත් පීරිස් මහතා
- ජී. හෙට්ටිආරච්චි මහතා
- රන්ජනී අරන්දර මිය
- මර්වින් ගුණවර්ධන මහතා
- ශ්‍රී ලංකා තෙවන ඇස ඡායාරූප හා මාධ්‍ය ශිල්පී සංගමය,හලාවත
- ඒ. ආර්. ඒ. එස්. බණ්ඩාර මහතා
- නිරෝෂ් වරුසවිතාන මහතා
- ඩී. සෙනෙවිරත්න මහතා
- උපනන්ද සෙනෙවිරත්න මහතා
- විජය බස්නායක මහතා
- වින්ද්‍යා බස්නායක මිය
- සී. විල්බට් ප්‍රනාන්දු මහතා
- කේ. කේ. පී. ආර්. ජයකොඩි මහතා
- ශාන්ත වීරසිංහ මහතා
- අතුල ජයසුන්දර මහතා
- කුමාර කරව්දෙණිය මහතා
- අමන්දා ජයවර්ධන මිය
- තිනේෂා එදිරිසිංහ මිය
- නිහාල් අබේරත්න මහතා
- එච්. එම්. ආර්. පෙරේරා මහතා
- ශාන්ත ගුණරත්න මහතා














# අපට ඔබව අවශ්‍යමයි..!!

**ඉතින් හැකි ඉක්මණින්..**
**ඉරුදිනක මහබෝධියට ඇවිත්..**
**සාමාජිකත්වය යාවත්කාලීන කරගන්න..**

(01 - නාම ලේඛනය)

මේ වන විට සාමාජික මුදල් ගෙවා නොමැති සාමාජික භවතුන් ව්‍යවස්ථාව ප්‍රකාරව නාම ලේඛනයෙන් ඉවත්කිරීමට තීරණය කර ඇත. ඒ අනුව පහත ලේඛනයේ සඳහන් සාමාජික භවතුන්ගේ සාමාජික හිමිකම් අහෝසි කිරීමට නියමිත ය. ඔබේ සාමාජික අංකය ද පහත ලේඛනයේ ඇතුළත්ව ඇත්නම් වහා ම සියලු හිඟ සාමාජික මුදල් ගෙවා සාමාජිකත්වය රැකගන්න. ඒ සඳහා ගරු මුදල් අධ්‍යක්ෂ කීර්ති නිශ්ශංක මහතා 0777 79 66 17 අමතන්න. එය එසේ නොවන්නේ නම් 2018 ජූනි මස 30 වැනි දිනෙන් ඔබගේ සාමාජිකත්වය අවසන් වන බව කරුණාවෙන් සලකන්න. ඊළඟ පිළිසඳර කලාපය සමග "02 - නාම ලේඛනය" පලකරනු ඇත.

| | |
|---|---|
| OM1357 | Mr. JG Premasiri |
| OM2155 | Mr. AK Nanayakkara |
| OM2420 | Mr. Mervyn Senanayake |
| OM2657 | Mr. LD Gunawardhane |
| OM2938 | Ms. WDS Fernando |
| OM3146 | Mr. LG Jayasuriya |
| OM3189 | Mr. PLIP Gunasekara |
| OM3230 | Mr. PR Premakumara |
| OM3496 | Mr. PAM Prasanna |
| OM3533 | Mr. SS Somarathne |
| OM3763 | Mr. AMSS Bandara |
| OM4273 | Mrs. Rekha NP Abeyasinghe |
| OM4426 | Mr. KSN Alwis |
| OM4490 | Mr. HNJC Silva |
| OM4586 | Mr. AWADN Abeysekara |
| OM4674 | Mr. RJ Priyantha |
| OM4799 | Mr. RA Liyanaarachchi |
| OM4870 | Ms. W L K Weerakkody |
| OM4882 | Mr. WM Iroshana |
| OM4912 | Mr. SS Gamage |
| OM4918 | Mr. SJ Sudusinghe |
| OM5055 | Mr. MMSB Munasinghe |
| OM5101 | Mr. MAAT Geetharanga |
| OM5165 | Mr. ACS Perera |
| OM5236 | Mr. RACSK Wijesinghe |
| OM5387 | Mr. PC Mudunkotuwa |
| OM5431 | Mr. RA Kumarasiri |
| OM5450 | Mr. VSB Konara |
| OM5484 | Mr. HKS Sathyajith |
| OM5510 | Mr. MAH Niroshan Perera |
| OM5518 | Mr. ND Gunawardhane |
| OM5544 | Mr. PMIV Rathnayake |
| OM5579 | Mr. PDD Nayanajith |
| OM5608 | Mr. Hettipathirana KNC |
| OM5619 | Mr. S Sunthararajan |
| OM5621 | Mr. Ramzoon MSM |
| OM5630 | Ms. Thathsarani UGS |
| OM5648 | Mr. Indika KKGN |
| OM5656 | Mr. Agasthi VT |
| OM5720 | Mr. Basnayake SA |
| OM5723 | Mr. Premachandra GLS |
| OM5725 | Mr. Galagoda GGL |
| OM5747 | Mr. Premadasa HMSN |
| OM5751 | Mr. Balasuriya CI |
| OM5752 | Mr. Ranatunga WVCK |
| OM5809 | Mr. Sanjeewa KNN |
| OM5811 | Ms. Somapala RDAP |
| OM5814 | Mr. Menaka Sanjeewa MW |
| OM5815 | Dr. Pallegama RW |
| OM5830 | Mr. Dissanayake DMNSB |
| OM5833 | Ms. Senevirathne NSAHH |
| OM5835 | Mr. Gamage PGC |
| OM5836 | Ms. Gnanarathne HS |
| OM5837 | Mr. Wijesinghe WAN |
| OM5843 | Mr. Kalinga R |
| OM5849 | Mr. Jamaldeen MF |
| OM5853 | Mr. Liyanage KRU |
| OM5854 | Mr. Bandara KVSV |
| OM5857 | Mr. Rathnayake RMB |
| OM5858 | Mr. Ekanayake WVA |
| OM5859 | Mr. Munasinghe SL |
| OM5862 | Mr. Wijayasiriwardane KTL De |
| OM5879 | Mr. Herath AHMTHB |
| OM5906 | Mr. Maduranga RP |
| OM5960 | Ms. Wijerathne TDMA |
| OM5968 | Mr. Gunasekara UP |
| OM5981 | Mr. BRLP Gunathilaka |
| OM5995 | Mr. SASC Suraweera |
| OM6002 | Mr. AID Perera |
| OM6022 | Mr. TN Wijesekara |
| OM6029 | Mr. BB Nuwan |
| OM6046 | Mr. TMD Chaturanga |
| OM6051 | Ms. BP Samarasinghe |
| OM6053 | Mr. OLJDA Perera |
| OM6054 | Ms. TVSN Buddhipriya |
| OM6059 | Mr. MG Falaldeen |
| OM6078 | Mr. BYC Perera |
| OM6080 | Mr. KAR Laksiru |
| OM6088 | Mr. KJ Daniel |
| OM6089 | Mr. SW Sri Lal |
| OM6096 | Ms. KVC Karunarathne |
| OM6099 | Mrs. SV De Silva |
| OM6100 | Mr. LC Kumara |
| OM6109 | Mr. WAKP Silva |
| OM6117 | Mr. DRS Podduwage |
| OM6118 | Mr. MGT nayanapriya |
| OM6119 | Mr. PAJ Rupananda |
| OM6133 | Ms. MUA Ariyarathne |
| OM6144 | Mr. KM Kumburegedara |
| OM6152 | Mr. MADTL Gunathilake |
| OM6155 | Mr. RKS Kumara |
| OM6159 | Mr. WKM Perera |
| OM6160 | Mr. YMI Silva |
| OM6172 | Mr. KL Priyankara |
| OM6173 | Mr. AWC Sampath |
| OM6174 | Mr. LRL Perera |
| OM6178 | Mr. AA Thalgahagoda |
| OM6184 | Mr. HLM Neomal |
| OM6185 | Ms. MASN Palihawadana |
| OM6187 | Mr. SOMMN Samarasekara |
| OM6188 | Mr. HMASS Kumara |
| OM6204 | Ms. SHS Chithrananda |
| OM6205 | Ms. LGP Kaushalee |
| OM6206 | Mr. SWKBRK Siriwardhane |
| OM6209 | Mr. HD Krishantha |
| OM6211 | Mr. MDS Lakshan |
| OM6216 | Mr. GGOAK De Silva |
| OM6238 | Mr. WW Pathiraja |
| OM6239 | Mr. D Samarasinghe |
| OM6240 | Mr. N Manivanan |
| OM6241 | Mr. PYSP Perera |
| OM6242 | Mr. TSA Fernando |
| OM6244 | Mr. SDSS Madhushanka |
| OM6245 | Mr. PGMS Jayasinghe |
| OM6246 | Mr. TMS Dole |
| OM6248 | Mr. KDS Sandaeuwan |
| OM6249 | Mr. RGO Subasinghe |
| OM6250 | Ms. HASL Hettiarachchi |
| OM6251 | Mr. SMS Fernando |
| OM6254 | Ms. PKWM Nonis |
| OM6255 | Mr. MGDR Ariyawansha |
| OM6256 | Mr. HSMP Piyathissa |
| OM6257 | Mr. HLJ Dharmakeerthi |
| OM6260 | Mr. HACD Gunasekara |
| OM6262 | Mr. WHMNC Wijekoon |
| OM6263 | Mr. IHDN Jayarathne |
| OM6265 | Mr. SPJG Premarathne |
| OM6266 | Mr. WAKG Somathilaka |
| OM6267 | Mr. WASS Kaushalya |
| OM6268 | Mr. PVSS Hevawasam |
| OM6269 | Mr. SHAP Wijerathne |
| OM6272 | Mr. BCM Jayawardhana |
| OM6273 | Mrs. KC Sahabandu |
| OM6274 | Mr. BDP Lakmal |
| OM6275 | Ms. ESP Kumarage |
| OM6276 | Mr. PTM Godakumbura |
| OM6277 | Mr. DGS Dissanayake |
| OM6278 | Mr. ARS Pavithra |
| OM6279 | Ms. YGOK Dinushika |
| OM6280 | Ms. IMAM Kumari |
| OM6282 | Mr. DL Priyan |
| OM6285 | Mr. MPP Liyanage |
| OM6287 | Mr. GDM Prasad |
| OM6288 | Mr. MCHP Fernando |
| OM6292 | Ms. HRC Lakshini |
| OM6293 | Mr. HDHR Bandurathne |
| OM6294 | Mr. OVAP Dhananjaya |
| OM6296 | Mr. CS Gurusinghe |
| OM6297 | Mr. WDD Jayasundara |
| OM6298 | Ms. KGM Munasinghe |
| OM6299 | Ms. DMRK Dissanayake |
| OM6300 | Ms. EWL Rathnasiri |
| OM6301 | Ms. HKA Erangi |
| OM6302 | Mr. KWP Hansaka |
| OM6303 | Ms. WANK Wasala |
| OM6304 | Ms. TKT Rukmali |
| OM6305 | Mr. WS De Silva |
| OM6306 | Mr. DKS Nipuna |
| OM6307 | Mr. NACR Nishshanka |
| OM6309 | Mr. DACL Gunawardena |
| OM6310 | Mr. HMAS Herath |
| OM6311 | Ms. TIP Piyasena |
| OM6312 | Mr. MMK Padmalal |
| OM6313 | Mr. AGWG Kumara |
| OM6314 | Mr. WANM Ranaweera |
| OM6315 | Ms. SB Ranasinghe |
| OM6316 | Ms. BAM Dilrukshi |
| OM6317 | Ms. AS Priyabashani |
| OM6318 | Mr. WPK Dhananji |
| OM6319 | Mr. JP Karunanayake |
| OM6320 | Mr. PSI Abeykoon |
| OM6321 | Mr. LP Gamagedara |
| OM6322 | Mr. SD Wickramasuriya |
| OM6323 | Mr. JHGK Chaturanga |
| OM6324 | Mrs. MRR Senadheera |
| OM6325 | Mr. MNS Kumara |
| OM6326 | Mr. DW Priyadarshana |
| OM6329 | Mr. MJ Lakshitha |
| OM6330 | Mr. SH Dalandawatta |
| OM6332 | Mr. DMAIGS Dharmarathne |
| OM6333 | Mr. KTCS Gunarathne |
| OM6334 | Mr. LSADE Akalanka |
| OM6336 | Mr. NGDA Perera |
| OM6337 | Mr. KLGNC Amarawansha |
| OM6338 | Mr. U Samantha |
| OM6339 | Mr. DMCJC Wimalasena |
| OM6341 | Mr. HPRC Senarath |
| OM6342 | Mr. SKDH Madumal |
| OM6343 | Mr. PBC Kulatunga |
| OM6344 | Mr. HRAS Wickramanayake |
| OM6345 | Mr. WMKMMA Fernando |
| OM6346 | Mr. NB Weerawansha |
| OM6347 | Mr. JL De Soyza |
| OM6350 | Mr. PKD Sanjaya |
| OM6351 | Mr. GRN Wijayarathne |
| OM6354 | Mr. IBDJT Weerawardhana |
| OM6355 | Ms. MDDW Rodrigo |
| OM6357 | Mr. RT Chaminda |
| OM6358 | Mr. SHM Jayasinghe |
| OM6364 | Ms. LM Kalubowila |
| OM6366 | Mr. GC Kumarapperuma |
| OM6370 | Mr. UKC Weerarathne |
| OM6371 | Ms. BASN Somasekara |
| OM6373 | Mr. WPC Pathirana |
| OM6376 | Mr. DUG Bandaragoda |
| OM6379 | Mr. AKCT Bandara |
| OM6380 | Ms. RDCP Karunarathne |
| OM6381 | Mr. Premalal |
| OM6384 | Mr. KKSP Kalahewatta |
| OM6385 | Mr. CSK Chandrasekara |
| OM6386 | Ms. AWS Lakshani |
| OM6387 | Mr. HCSB Silva |
| OM6388 | Ms. HCR Thuyakontha |
| OM6389 | Mr. HASS Vimukthi |
| OM6390 | Mr. LAPH Rupasinghe |
| OM6392 | Mr. LDCSG Abeyrathne |
| OM6395 | Ms. MWW Anuradhi |
| OM6396 | Mr. YK Senevirathne |
| OM6400 | Mr. WADRK Wijesooriya |
| OM6402 | Mr. VY Attalage |
| OM6403 | Mr. PDAR Pinnalawatta |
| OM6405 | Mr. EAP Madushanka |
| OM6407 | Mr. AADV Amaratunga |
| OM6409 | Mr. HHS Nishantha |
| OM6410 | Ms. KPA Himesha |
| OM6411 | Mr. PD Withanage |
| OM6412 | Mr. RMPSW Rathnayake |
| OM6413 | Ms. WUWR Dissanayake |
| OM6414 | Mr. AHNGWB Abeysinghe |
| OM6416 | Mr. JMC Madushanka |
| OM6417 | Mr. RGID Bandara |
| OM6418 | Ms. DMJC Dissanayake |
| OM6419 | Ms. NGNP Niyandagala |
| OM6420 | Mrs. PGDSMA Senevirathne |
| OM6422 | Mr. PC Pushpakumara |
| OM6423 | Mr. WLR Costa |
| OM6424 | Mr. TNR Fernando |
| OM6425 | Mr. MA Rahaman |
| OM6426 | Ms. PO Wattuhewa |
| OM6427 | Mr. KRDDW Rathnaweera |
| OM6428 | Mr. JPAS Kumara |
| OM6429 | Ms. PW Deepika |
| OM6430 | Ms. PLS Tharanga |
| OM6432 | Ms. WNPK Fonseka |
| OM6433 | Mr. ADC Darshana |
| OM6434 | Mr. JAMR Saram |
| OM6435 | Mr. NKG Gunarathne |
| OM6436 | Ms. DU Lanarol |
| OM6437 | Mr. KDHD Deshapriya |
| OM6438 | Mr. HRHMK Nadeniya |
| OM6439 | Ms. PWAS Palihawadana |
| OM6441 | Mr. GSKSB Fernando |

# ජයග්‍රහණ

## මාසික තරග ජයග්‍රහණ - (2018 මාර්තු 04)



■ ඒක වර්ණ
01. මොහාන් ගුරුසිංහ
02. චමිත් බාලසිංහ
03. සමීර කොතලාවල
04. ගගන් කරුණාචන්ද්‍ර
05. නිපුන ගල්හේනගේ

*ඡායාරූප තේරීම් කමිටුව :*
*ප්‍රියන්ත අමරසිංහ මහතා*
*ප්‍රියන්ත අබේසුන්දර මහතා*
*යමුනි රශ්මිකා මිය*



■ වර්ණ
01. හසාර මධුශානි
02. නිශාන්ත මල්ලවආරච්චි
03. චන්දනා ඩයස්
04. ගගන් කරුණාචන්ද්‍ර
05. ඉරෝශන් බණ්ඩාර

## මාසික තරග ජයග්‍රහණ - (2018 මැයි 06)



■ ඒක වර්ණ
01. ගගන් කරුනාචන්ද්‍ර
02. සමීර කොතලාවල
03. නිශාන්ත මල්ලවආරච්චි
04. ගගන් කරුණාචන්ද්‍ර
05. ඉරෝශන් බණ්ඩාර

*ඡායාරූප තේරීම් කමිටුව :*
*කේ. පී. කීර්තිරත්න මහතා*
*සම්පත් පීරිස් මහතා*
*විරාජ් ලියනාරච්චි මහතා*



■ වර්ණ
01. ගිම්හාන් ජයසිංහ
02. නිලූප සිල්වා
03. සමීර කොතලාවල
04. ගගන් කරුණාචන්ද්‍ර
05. සමීර කොතලාවල

*මාසික තරග සංවිධායක කමිටුව - මධුරංග අබේවර්ධන (0773 549 449)*
*ශෙහාන් ප්‍රනාන්දු | මනිල්ක ජයසිංහ | හේමමාලි අල්විස්*

# ප්‍රකාශන පුවත්

## ඔබේ තොරතුරුත් පිළිසඳරට ලියන්න

ඔබේ ඡායාරූප දිවියේ ජයග්‍රහණ, වැදගත් කඩඉම්, සංගමයේ සාමාජිකයින් සමග බෙදාගන්නට. ඔබේ තොරතුරුත් පිළිසඳරට යොමුකරන්න.



ගරු. ප්‍රකාශන අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය,
නො. 170, කොළොන්නාව පාර, දෙමටගොඩ, කොළඹ 09.
Email: kmanujith@gmail.com | T.P: 0716 450 871 / 0766 450 693

## 2018 ශිෂ්‍ය අත්පොතටත් සුපුරුදු අනුග්‍රහයම

2018 ඡායාරූප පාඨමාලා විද්‍යාර්ථීන් සඳහා වන ශිෂ්‍ය අත්පොත මුද්‍රණය කරලීමට පසුගිය දෙවසරේ මෙන් ම මෙවර ද මහනුවර සහ කොළඹ පිහිටි A Pictures ආයතනය විසින් මුද්‍රණ අනුගහය ලබාදීම කෘතවේදීත්වයෙන් අගය කරමු. අප ජ්‍යෙෂ්ඨ සාමාජික අතුල ජයසුන්දර මහතාගේ අධිපතිත්වයෙන් කටයුතු කරන මහනුවර ද කැන්ඩි සිටි සෙන්ටර් හි A Picture මෙන් ම කොළඹ 11, හෙට්ටිවීදියේ A Pictures ආයතනය මෙම කාරුණික උපකාරය සංගමය වෙනුවෙන් ඉටුකරනු ලැබී තිබේ.

A Pictures
The Photo Shop






## ඔහු මෙසේ කීය...

**මා සැමදා විශ්වාස කර ඇත්තේ නාට්‍යයකට කළ නොහැකි දෙයක් කිරීමට කැමරාවට අද්විතීය බලයක් ඇති බවයි. එනම් හෙළිදරව් කිරීමට, අවලෝකනය කිරීම, හැඟීම් දැනවීමට ඇති බලයයි.**

**-ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්**

## පිළිසඳරට වෙහෙස මහන්සිය

**ප්‍රකාශන අධ්‍යක්ෂ - මනුජිත් කටුගම්පොළ**

**ආවරණ අධ්‍යක්ෂ, ප්‍රකාශන - ලහිරු ජයසිංහ**

පිළිසඳර ප්‍රකාශන අනුකමිටුව

මධුෂිකා ලක්මාලි/ චමින්ද වීරසිංහ/ දිනෙත් ප්‍රනාන්දු/ ගිහාන් දුල්වල/ මින්දුරි අබේසේකර/ අයේශා ලියනගේ/ රශේන්ද්‍ර ඩිල්ෂාන්/ ක්‍රිෂාන් ගීතික/ නදීර ඩිල්ෂාන්/ ඉඳුවර උවන්ප්‍රිය/ තිලානි ශානිකා/ අර්ජුන සුමින්ද/ ගීතිකා නිසංසලා/ අසංග මුණසිංහ